(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 8(2).]

# පාර්ලිමේන්තුවේ අංක 8 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 අප්‍රේල් මස 24 වැනි බදාදා**

## 2013 මැයි මස 07 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ රෙගුලාසි,— 1969 අංක 16 දරන පනතින්, 1981 අංක 21 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 9 දරන පනතින් සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 හා 156 වැනි වගන්ති යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් 07 දිනැති අංක 1787/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2013.04.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

*

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2013 මැයි මස 21 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2497/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සහල් පිටි උපයෝගී කර ගනිමින් පාන්, බනිස් ඇතුළු බේකරි නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා වර්ෂ 2005 සිට 2012 දක්වා කාලය තුළ රජය වෙන් කර ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම නිෂ්පාදන කටයුතු සඳහා මිල දී ගෙන ඇති යන්ත්‍ර සූත්‍ර කවරේද;

(ii) එම යන්ත්‍ර සූත්‍රවල වටිනාකම් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒවා ලබා දී ඇති පුද්ගලයින් හෝ ආයතන කවරේද;

(iv) මේ වන විට එම යන්ත්‍ර සූත්‍රවල තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන ලබා ඇති වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) තිරිඟු පිටි බේකරි නිෂ්පාදන වෙනුවට සහල් පිටි බේකරි නිෂ්පාදන රට තුළ පූර්ණ වශයෙන් භාවිතය ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සකසා තිබේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2975/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අධ්‍යාපන බලධාරීන් වගකීමකින් තොරව ක්‍රියා කිරීම හේතුවෙන් මාතර අධ්‍යාපන කලාපයේ 2012 දෙවැනි පාසල් වාර පරීක්ෂණය සඳහා 2009 වර්ෂයේදී ලබාදුන් විභාග ප්‍රශ්න පත්‍රයක් නැවතත් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මෙවැනි ගැටලු සහගත තත්ත්වයන් ඇතිවීමට හේතු කවරේද;

(ii) එවැනි තත්ත්වයන්ට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3065/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව සඳහා පත්කළ යුතු සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සාමාජිකයන් සතු වගකීම් කවරේද;

(iii) එම සාමාජිකයන් පත්කිරීම පිළිබඳ වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පවරා ඇති අය කවුරුන්ද;

(iv) මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් මේ වන විට පත්කර තිබේද;

(v) නොඑසේ නම්, එම ව්‍යවස්ථාපිත වගකීම් පැහැර හැරීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3143/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හතලිස් තුන් ලක්ෂයක් පමණ වන පාසල් සිසුන් අතරින් උසස් අධ්‍යාපනය සඳහා වරම් ලබන ප්‍රතිශතය කොපමණද;

(ii) ලෝකයේ වෙනත් රටවලට සාපේක්ෂව එම ප්‍රතිශතය අවම මට්ටමක පවතින බව පිළිගන්නේද;

(iii) අධ්‍යාපනය වෙනුවෙන් 2012 වර්ෂය හැර පසුගිය වර්ෂ විස්සක කාලය තුළ යෙදවූ මුදල ඒ ඒ වර්ෂවල දළ දේශීය ආදායමේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2012 වර්ෂය තුළ අධ්‍යාපනය වෙනුවෙන් රජය වෙන්කළ මුදල දළ දේශීය ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාසල් අධ්‍යාපනය වෙනුවෙන් දෙමාපියන්ගෙන් මුදල් එකතු කිරීම මේ වනවිට සාමාන්‍යයෙන් පවතින ක්‍රියාවලියක් බවත්;

(ii) එයට හේතුව රජය අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් නොකිරීම බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3401/'13

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ මැද භාගයේදී වට්ටුවාවලයි හිදී අවතැන් ජනයා රැස්කොට, එල්.ටී.ටී.ඊ සංවිධානය සමග එක්දිනක් හෝ සබඳතා පැවැත්වූ අයට භාරවන ලෙසට යුද හමුදාව විසින් දැනුම් දී තිබුණේද;

(ii) එසේ නම්, ඒ අනුව භාර වූ දෙමළ තරුණියන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) යුද හමුදාවේ ඉහත දැනුම්දීම අනුව 2009.05.16 දින මුලතිව්, වට්ටුවාවලයිහිදී යෝගනාදන් විජිතා සහ සෙලව්රුබන් තිරුදබන්, 2009.05.15 දින රෙට්ටවයික්කාල්, මුල්ලිවෙයික්කාල්හිදී අඩන්කලන් සුදාකරන් සහ 2010.09.02 දින වව්නියාවේ ජෝසප් කඳවුරේ දී කන්දසාමි ජෝති රාසා යන අය යුද හමුදාවට භාර වූ බව එතුමා දන්නෙහිද;

(ඇ) එසේ හමුදාවට භාර වූ ඉහත නම් සඳහන් පුද්ගලයන් සම්බන්ධයෙන් යුද හමුදාව හෝ රජය ගත් ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3406/'12

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් හුම්බුළුව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පෞරාණික වැවක් පිහිටා ඇති බවත්;

(ii) මේ වන විට එම වැවේ කොටසක් ගොඩකර ඇති බවත්;

(iii) එම වැව සංවර්ධනය කිරීම තුළින් ගොවීන් විශාල සංඛ්‍යාවකට සෙත සැලසෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැව අයත් ඉඩම සතු වන්නේ කවුරුන්ටද;

(ii) අයිතිකරුවන් සිටී නම්, ඊට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3434/'13

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජා-ඇල, කපාලකන්ද පාර, කණුවනවත්ත, අංක 103 හි පදිංචි ජේ. එම්. සී. රත්නායක මහතාගේ ඉඩමට බලපෑ හැකි වෙනත් ඉඩම් බෙදීමකට එරෙහිව පැනවූ කේවියට් තහනම් නියෝග දෙකක් පෑලියගොඩ කොට්ඨාසයේ පොලිස් අධිකාරී මහේෂ් පෙරේරා මහතාගේ දැඩි බලපෑම් මත ඉවත්කර ගත් බවත්;

(ii) කේවියට් තහනම පවතිද්දීත් එම ඉඩම බෙදීමට අදාළ ඉඩම් හිමිකරු යුද හමුදා නිලධාරීන් සමග 2012.05.12 දින පැමිණ ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ආකාරයේ පෞද්ගලික ආරවුලකට රජයේ ආරක්ෂක අංශ යොදවාගෙන ඇත්තේ කෙසේද;

(ii) ඉහත පොලිස් අධිකාරීවරයාගේ ක්‍රියාකලාපයට එරෙහිව ආරක්ෂක ලේකම්වරයාට, පොලිස්පතිවරයාට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කර ඇති ලිඛිත පැමිණිලි සම්බන්ධයෙන් සහ එම පොලිස් නිලධාරියාට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) උක්ත පොලිස් අධිකාරීවරයා විසින් මෙම ඉඩම් මැනීමට අදාළව කරනු ලබන තර්ජන හේතුවෙන් ජේ. එම්. සී. රත්නායක මහතාට, පවුලේ සාමාජිකයකුට හෝ දේපළවලට සිදුවිය හැකි හානි සම්බන්ධයෙන් සහ බලපෑම් මත සිදුකරනු ලබන එවැනි ඉඩම් මැනීමකදී රත්නායක මහතාගේ ඉඩමට සිදුවිය හැකි හානි සම්බන්ධයෙන් වගකීම භාර ගන්නා පාර්ශ්වය කවුරුන්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3435/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සෞදි අරාබියේ රියාද්හි ගෘහ සේවිකාවක වශයෙන් සේවය කර මෙරටට පැමිණි කොම්පඤ්ඤවීදියේ අන්වර් ෂියානා මහත්මිය විසින් හෙළි කරන ලද තොරතුරු අනුව එරටේ සිරකර තබාගෙන සිටින ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් 50ක් පමණ ගණිකා වෘත්තියෙහි යොදවමින් සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ පිළිබඳව සෙවීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පිරිස මුදවා ගෙන වහාම ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ගෘහ සේවිකාවන් පිරිස අතරමං කිරීමට ක්‍රියාකළ විදේශ සේවා නියෝජිත ඒජන්සි කරුවන්ට හා එයට මැදිහත් වූ අනෙකුත් අයට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම කාන්තාවන්ගේ පවුල්වල ආරක්ෂාව, සුබ සාධනය සහ ආර්ථිකය නංවාලීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙළක් ක්ෂණිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3441/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013 ජනවාරි මාසයේදී පමණ හම්බන්තොට වරාය සඳහා ඇ.ඩො. මිලියන 153 ක අතිරේක ණය මුදලක් චීනයෙන් ලබාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ණය මුදල ලබා ගත් නියමයන් සහ කොන්දේසි (පොළී අනුපාතය, ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන කාලය, අනිකුත් ගාස්තු) කවරේද;

(ii) මෙම ණය මුදල ලබාගත් බැංකුව කවරේද; කිසියම් දේශීය හෝ විදේශීය තැරැව්කරුවන් යොදා ගනු ලැබුවේද;

(iii) හම්බන්තොට වරාය සඳහා සියලුම මූලාශ්‍රවලින් ලබා ගෙන ඇති සම්පූර්ණ ණය මුදල එක් එක් මූලාශ්‍රයට අදාළ නියමයන් සහ කොන්දේසිද ඇතුළුව කවරේද;

(iv) මුල් ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් පසුව ඉහත (iii)හි සඳහන් ණය කොන්දේසි කිසිවක් කිසියම් අවස්ථාවක වෙනස්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 මැයි මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1935/'11

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 වර්ෂයේ මැයි සිට ජූලි දක්වා වන කාල සීමාව තුළදී ශ්‍රී ලංකාවට බාල තත්ත්වයේ පෙට්‍රල් සහ වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදන සැපයූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම් කවරේද;

(ii) අමාත්‍යාංශය බාල තත්ත්වයේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේදී සිදුවී ඇති වංචාවලින් බැහැර වන්නේ කෙසේද;

(iii) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීම නිසා අලාභහානි විඳීමට සිදු වූ පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීමෙන් ඇති වූ අලාභ හානි සම්බන්ධව පැමිණිලි කළ පාරිභෝගිකයන්ගේ නම් කවරේද;

(v) අලාභ හානි විඳීමට සිදු වූ එක් එක් පාරිභෝගිකයාට වන්දි වශයෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(vi) තත්ත්වයෙන් බාල පෙට්‍රල් හේතුවෙන් හානි වූ යන්ත්‍රෝපකරණ සහිත ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(vii) එම ඉන්ධන පිරවුම්හල්වලට වන්දි ලබාදෙන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) තත්ත්වයෙන් බාල පෙට්‍රල් පිළිබඳ වංචාව ජනතාවට හෙළිකළ පාර්ශ්වයන් වෙත ආකර්ෂණීය ප්‍රසාද දීමනාවක් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2977/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා පරිපාලනය විසින් සිදුකර ඇති මුදල් වංචා පිළිබඳව අදාළ නිලධාරීන් විසින් වගකිවයුතු බලධාරීන්ට ලිඛිත සාක්ෂි සහිතව කරුණු ඉදිරිපත් කළද මේ වන තෙක් ඊට කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා පරිපාලනය විසින් මේ වන විට වංචා කර ඇති මුදල් ප්‍රමාණය සහ එසේ සිදු කළ අවස්ථා ගණන පිළිබඳ නිවැරදි සංඛ්‍යාත්මක තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) අදාළ බලධාරීන් විසින් මූල්‍ය වංචාවන්ට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් මේ වන තෙක් පියවර නොගැනීමට හේතු කවරේද;

(iii) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වංචනික නිලධාරීන්ට මහජනතාවගේ මුදල් ගසා කෑමට ඉඩ නොදී, ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3066/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) මධ්‍යම පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති; සහ

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පළාත් සභා වෙත විශේෂයෙන් පවරා ඇති විෂය සහ කාර්යයන්වලට අදාළව ප්‍රඥප්ති පැනවීම අවම වශයෙන් සිදුවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3200/'12

ගරු පී. හැරිසන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු මැද පළාත් සභාව මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති කිරිහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කිරිහල් ඉදිකර ඇති ස්ථාන කවරේද;

(iii) එම එක් කිරිහලක් සඳහා වැයකළ මුදල කොපමණද;

(iv) එම කිරිහල්වල ගවයින්ගේ ඡායාරූපවලට අමතරව වෙනත් අයගේ ඡායාරූප ප්‍රදර්ශනය කරනු ලබන්නේද;

(v) එසේ නම්, එම ඡායාරූප කාගේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කිරිහල් අතරින් මේ වනවිට ජනතාවගේ ප්‍රයෝජනය සඳහා විවෘතව ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රයෝජනයට නොගෙන වසා දමා ඇති කිරිහල් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කිරිහල් පවත්වාගෙන යෑම සඳහා බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) එම සේවකයින්ගේ පත්වීම් සිදුකර ඇත්තේ ස්ථිර, තාවකාලික හා සේවා අවශ්‍යතාවයන් අනුව යන පදනම් අතරින් කවර පදනමක් යටතේද;

(v) මෙම කිරිහල් සඳහා කිරි සපයනු ලබන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3403/'13

ගරු අජිත් කුමාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව, මුරකඩ්ඩාන්චෙන්නිහි පදිංචි සෙල්ලාපිල්ලෙයි මහේන්ද්‍රන් නමැත්තෙකු බන්ධනාගාරගත කර සිටීද;

(ii) එසේ නම්, එම බන්ධනාගාරය කවරේද;

(iii) ඔහු බන්ධනාගාරගත කර තිබෙන්නේ සිරකරුවෙකු ලෙසද; නොඑසේ නම්, සැකකරුවෙකු ලෙසද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඔහු අත්අඩංගුවට ගත් දිනය, ස්ථානය සහ අත්අඩංගුවට ගැනීම සිදු කරන ලද්දේ කා විසින්ද;

(ii) ඔහු අත්අඩංගුවට ගැනීමට හේතු වූ චෝදනාව සහ අදාළවූ නීතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මහේන්ද්‍රන් නමැත්තාට එරෙහිව අධිකරණය ඉදිරියේ නඩු පවරා තිබේද;

(ii) එසේ නම්, ඊට හේතුවූ චෝදනා, නඩු පැවරූ දිනය, නඩු අංකය හා අධිකරණය කවරේද;

(iii) එම නඩුවේ වත්මන් තත්ත්වය කවරේද;

(iv) එම තැනැත්තා නිදහස් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3436/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොතුහැර ප්‍රදේශයේ පදිංචිව සිටි වලිමුණිදේවගේ ශිලාවති නමැත්තිය සෞදි අරාබියේ රැකියාවක නිරතව සිටියදී මරණයට පත්වූ බවත්;

(ii) ඇයගේ මරණය සිදුවී ඇත්තේ කරපටියකින් ගෙල සිර කිරීමකින් බව මරණ පරීක්ෂණයෙන් හෙළිවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශිලාවති නමැත්තියගේ මරණය සම්බන්ධ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(ii) එම මරණය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

(iii) මියගිය එම තැනැත්තිය වෙනුවෙන් හිමිවිය යුතු රක්ෂණ හිමිකම් හා වන්දි මුදල් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3442/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රජය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා දේශීය වාණිජ බැංකු වෙතින් ණය ලබා ගැනීම ආරම්භකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) සියලුම දේශීය වාණිජ බැංකු වෙතින් ලබාගත් ණය මුදල් ප්‍රමාණයන්, ණය ආපසු ගෙවීමට ලබා දී ඇති කාලය, පොලී අනුපාත සහ වෙනත් කොන්දේසි සමඟ වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2978/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිවිල් ගුවන් සේවා අධිකාරිය පිහිටුවා වර්ෂ 10ක් ගතවී ඇතත්, මේ වනතෙක් එම ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති බවත්;

(ii) එම අධිකාරියේ වගකිව යුතු බලධාරීන් විසින් රාජ්‍ය මුදල් අවිධිමත් ලෙස හා අපරීක්ෂාකාරී ලෙස වැය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 10ක් පුරා සිවිල් ගුවන් සේවා අධිකාරිය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා ගෙවා ඇති කුලී මුදල කොපමණද;

(ii) බිම් කුලිය ලෙස විශාල බදු මුදලක් ගෙවන එම අධිකාරිය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iii) එම ආයතනයේ මුදල් අපරීක්ෂාකාරී ලෙස පරිහරණය කළ බලධාරියාට එරෙහිව යම් ක්‍රියාමාර්ගයක් ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3067/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) උතුරු මැද පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද;

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති; සහ

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 මැයි මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2201/'11

ගරු රවි කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2011 වර්ෂය තුළ මෙම අමාත්‍යාංශය විසින් කලුතර දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) 2012, 2013 සහ 2014 යන වර්ෂවලදී ඉදිකිරීමට අපේක්ෂා කෙරෙන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් නිවාස ඉදිකිරීම සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම අලුතින් ඉදිකරනු ලැබූ නිවාස නොමිලේ ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, එම නිවාස අලෙවි කරනු හෝ කුලියට දෙනු ලබන්නේ කවර මිලකටද;

(iii) එම නිවාස ලබා දෙන පදනම කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2504/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා තිබෙන ජනකපුර විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනකපුර විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2634/’12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවලදී ශ්‍රී ලංකාවේ පැවැත්වූ ටෙස්ට් ක්‍රිකට් තරඟාවලියට ඇතුළත් වූ තරඟ සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ පැවත්වූ ක්‍රීඩාංගන කවරේද;

(iii) එම එක් එක් ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරයේ ඇති ආසන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ක්‍රීඩාංගනවල ප්‍රේක්ෂකාගාරයන්හි ආසන සඳහා අය කරනු ලැබූ ගාස්තු කවරේද;

(v) මෙම තරඟමාලාව නැරඹීම සඳහා අලෙවි කළ එක් ටිකට්පතක මිල කොපමණද;

(vi) එම ටිකට්පත වලංගු වූ කාල සීමාව කවරේද;

(vii) ඉහත ක්‍රීඩාංගනවල එක් ප්‍රේක්ෂක ආසනයක් සඳහා රු. 5000.00ක අවම මුදලක් අයකර තිබේද;

(viii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3068/’12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) ඌව පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති; සහ

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3286/’12

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඒකාබද්ධ සේවයට අයත් රජයේ භාෂා පරිවර්තක සේවය තුළ උග්‍ර නිලධාරී හිඟයක් පවත්නා බවත්;

(ii) එම සේවයට බැඳීමට හා සේවයේ රැඳීමට දිරිදෙන වැටුප් හා වරප්‍රසාද ලබා නොදීම තුළ බාහිරින් පිරිස් සේවයට ආකර්ශණය නොවීමත්, සේවයට බැඳුනු පිරිස්ද නොකඩවා සේවය හැර යාමත් මෙම නිලධාරී හිඟයට හේතුවන බවත්;

(iii) අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සමස්ත සේවය, පෙරදී එයට සමාන්තරව පැවති සෙසු සේවා හා සාපේක්ෂව වැටුප් පරිමාණ අගයන්ගෙන් පහත හෙළා ඇති බවත්;

(iv) මෙම තත්ත්වය ත්‍රිභාෂාමය ශ්‍රී ලංකාවක් උදෙසා වූ වැඩ පිළිවෙලට මුළුමනින්ම පටහැනිවූවක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත භාෂා පරිවර්තක සේවයට අහිමි කරන ලද නිසි පිළිගැනීම හා සේවා තත්ත්වය නැවත ලබාදීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ගනු ලැබ ඇති එම පියවරයන් කවරේද;

(iii) එම පියවරයන් ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3335/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 ජනවාරි මස සිට මේ දක්වා වීසා රහිතව අනවසරයෙන් රටින් බැහැර වීමට ක්‍රියා කිරීම සීඝ්‍රයෙන් වැඩි වී ඇති බව පිළිගන්නේද;

(ii) එම කාල සීමාව තුළ නීතියේ රැහැනට හසු කරගත් නීති විරෝධී සංක්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම නීති විරෝධී සංක්‍රමණික ක්‍රියාවලිය ඉහත සඳහන් කාල සීමාවට පෙර සිට ක්‍රියාත්මකවී තිබේද;

(ii) නොඑසේ නම්, එම ක්‍රියාවලිය මෑතකදී ආරම්භ වී තිබේද;

(iii) නීති විරෝධී සංක්‍රමණිකයින් නීතියේ රැහැනට හසු කර ගැනීම මින් පෙර ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3404/'13

ගරු අජිත් කුමාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව, නාවල්කාඩු හි පදිංචි මාලරත්නම් සිංගරාසා නමැත්තකු බන්ධනාගාරගත කර සිටීද;

(ii) එසේ නම්, එම බන්ධනාගාරය කවරේද;

(iii) ඔහු බන්ධනාගාරගත කර තිබෙන්නේ සිරකරුවෙකු ලෙසද; නොඑසේ නම්, සැකකරුවෙකු ලෙසද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඔහු අත්අඩංගුවට ගත් දිනය, ස්ථානය සහ අත්අඩංගුවට ගැනීම සිදු කරන ලද්දේ කවුරුන්ද විසින්ද;

(ii) ඔහු අත්අඩංගුවට ගැනීමට හේතු වූ චෝදනාව සහ අදාළවූ නීතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මාලරත්නම් සිංගරාසා නමැත්තාට එරෙහිව අධිකරණය ඉදිරියේ නඩු පවරා තිබේද;

(ii) එසේ නම්, ඊට හේතුවූ චෝදනා, නඩු පැවරූ දිනය, නඩු අංකය හා අධිකරණය කවරේද;

(iii) එම නඩුවේ වත්මන් තත්ත්වය කවරේද;

(iv) එම තැනැත්තා නිදහස් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3069/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) සබරගමුව පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති; සහ

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3070/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) වයඹ පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මඟින් සම්මත කරන ලද;

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයන් වලට අදාළ ප්‍රඥප්ති; සහ

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමි ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?